# මිලින්ද මොරගොඩ පදනමෙන් චිත්‍ර හා රචනා තරගාවලියක්

ඔක්තෝබර් 03 වැනි දිනට යෙදී ඇති ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් කොළඹ නගරයේ වතු සහ මහල් නිවාස දරු දැරියන් ලක්ෂයක් සඳහා චිත්‍ර හා රචනා තරගාවලියක් පැවැත්වීමට "මිලින්ද මොරගොඩ පදනම" පියවර ගෙන තිබේ.

"ජනාවාසයේ දරුවෝ" නමින් නම් කර ඇති මේ තරගාවලිය පසුගිය 11 වැනි දින ආරම්භ විය.

මෙම තරගයට අදාළ නිර්මාණ එක්රැස් කිරීම 25 දින දක්වා සිදු කෙරෙන අතර, එම කාලය තුළදී තරග විනිශ්චය මණ්ඩලය එක් එක් නිවාස ව්‍යාපෘති වෙත ගොස් අදාළ නිර්මාණ පරීක්ෂා කිරීම හා එක්රැස් කිරීම සිදු කරනු ඇත. තෝරාගනු ලබන චිත්‍ර රැසක එකතුවක් යටතේ සංවිධානය කරන විශේෂ ප්‍රදර්ශනයක් ඔක්තෝබර් මස 02 වැනි දින විහාරමහා දේවි උද්‍යානය අභියස දී පැවැත්වේ. ජයග්‍රාහකයින්ට ත්‍යාග ප්‍රදානය එදින සිදු කිරීමට නියමිතය.

ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් මිලින්ද මොරගොඩ පදනමෙන් කොළඹ නගරයේ වතු සහ මහල් නිවාස දරු දැරියන් ලක්ෂයකට සිය ජනාවාස පිළිබඳ චිත්‍ර හා රචනා තරඟයක් පැවැත්වෙන අතර, ඒ සඳහා එම පදනමේ නිලධාරීන් නිවාස ව්‍යාපෘතිවලට ගොස් දූ දරුවන් දැනුවත් කරන අයුරු ඡායාරූපයෙන් දැක්වේ.